ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/27/02/23

# මාධ්‍ය නිවේදනය

ජාතික ජන බලවේගය 2023 පෙබරවාරි මස 26 වන දින ක්‍රියාත්මක කරන ලද විරෝධතා පා ගමන කොළඹ කොම්පඤ්ඤවීදිය පොලිස් බල ප්‍රදේශයේ යූනියන් පෙදෙස ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අවස්ථාවේදී, එම ප්‍රදේශය විරෝධතා පා ගමන් පැවැත්වීම තහනම් කරමින් අධිකරණ නියෝග නිකුත් කර නොතිබූ තත්වයක් තුළ ජල හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ලවීමත් සහ එම අවස්ථාවේ දී පුද්ගලයින් 28 දෙනෙකු පමණ තුවාල ලැබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත.

ඒ අනුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කඩිනම් පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, උක්ත සිදුවීම සම්බන්ධයෙන් 2023 පෙබරවාරි මස 28 (එනම් පැය 24ක කාලයක් ඇතුළත) වන දින පූර්ණ වාර්තාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලෙස පොලිස්පතිවරයා වෙත දන්වා යවා ඇත.  එම වාර්තාවේ කරුණු පදනම් කරගෙන ඉදිරි පරීක්ෂණ කටයුතු සිදුකරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.02.27